ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

# එකතු සංවර්ධන ප්‍රතිපත්තිය

# 2020

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

**දැක්ම**

"සමස්ත ජනතාවට පුස්තකාල හා තොරතුරු සේවා ප්‍රවේශයක් සපයන

ජාතික ඥාන කේන්ද්‍රය බවට පත්වීම "

**මෙහෙවර**

"දැනුවත් සමාජයක් බිහි කිරීම උදෙසා

ජාතියේ බුද්ධිමය උරුමය සුරැකීම

ජාතික පුස්තකාල හා විඥාපන සේවා පද්ධතිය සංවර්ධනය,

පුස්තකාල සේවා කාර්යක්ෂමතාව පිණිස තොරතුරු සහ සන්නිවේදන

තාක්ෂණය භාවිතයට දිරි දීම,

ග්‍රන්ථ විඥාපන පහසුකම් සැපයීම සහ

ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා අනුග්‍රහය දැක්වීම"

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 01. | පසුබිම | 1 |
| 02. | එකතු සංවර්ධන ප්‍රතිපත්තිය හැඳින්වීම | 1 |
| 03. | එකතු සංවර්ධන ප්‍රතිපත්තියේ මූලික අරමුණු | 2 |
| 04. | එකතු සංවර්ධන ප්‍රතිපත්තියක වැදගත්කම | 2 |
| 4.1 | සැලසුම්කරණය | 2 |
| 4.2 | පුස්තකාල සම්පත් තේරීම | 2 |
| 4.3 | පුස්තකාල සහයෝගීතාව | 2 |
| 4.4 | අදාළ පාර්ශව හා උපයෝජක සබඳතා | 3 |
| 05. | පුස්තකාල සම්පත් තෝරා ගැනීමේ ක්‍රමවේදය | 3 |
| 06. | එකතු සංවර්ධන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රියාපිළිවෙළ | 3 |
| 07. | පුස්තකාල සම්පත් | 3 |
| 08. | ජාතික පුස්තකාල එකතු සංවිධානයේ ප්‍රමුඛතා | 5 |
| 09. | පුස්තකාල සම්පත් අපහරණය | 5 |
| 10. | එකතු සංවර්ධන ප්‍රතිපත්තිය සමාලෝචනය | 6 |
| ආශ්‍රිත ග්‍රන්ථ | | 7 |
| උපලේඛන - | | |
| | අ - පරිත්‍යාග - පුද්ගල සහ ආයතන | 8 |
| | ආ - විද්වත් එකතු ලබා ගැනීම | 9 |
| | ඇ - අපහරණ නිර්ණායක | 10 |
| සංක්ෂිප්ත පද මාලාව | | 11 |

## ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
## එකතු සංවර්ධන ප්‍රතිපත්තිය

## 01. පසුබිම

වර්ෂ 1970 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මගින් ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය* 1970 වර්ෂයේ දී පිහිටුවනු ලැබූ අතර මෙම ආයතනයේ ප්‍රධාන අරමුණ හා වගකීමක් මෙන් ම කාර්යයක් වූයේ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පිහිටුවීම සහ පවත්වාගෙන යාමයි. එමෙන් ම ජාතික වශයෙන් ශ්‍රී ලංකාවේ ඇති සියලු ම පුස්තකාල සේවා සම්බන්ධීකරණය, සංවර්ධනය හා ජාතියේ සංවර්ධනයට අවශ්‍ය තොරතුරු සැපයීම ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රධාන අරමුණ විය. වර්ෂ 1970 සිට 1990 දක්වා කාල පරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ කාර්යයන් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූලික කටයුතු ඉටු කෙරිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1990 අප්‍රේල් මස 27 වන දින ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය නිල වශයෙන් විවෘත කිරීම සිදු වුව ද, ජාතික පුස්තකාල එකතුව ගොඩනැඟීම සහ පවත්වාගෙන යාමේ කාර්යය 1970 ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවීමේ සිට ම සිදු විය. 1998 අංක 51 දරන නව සංශෝධිත පනත යටතේ ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, **ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය** යනුවෙන් නම් කළ අතර , ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය **ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය** යනුවෙන් නම් කරන ලදී.

අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානයේ (IFLA) සහ යුනෙස්කෝ (UNESCO) සංවිධානයේ නිර්වචන අනුව **ජාතික පුස්තකාලයක වගකීම වන්නේ වර්තමාන හා අනාගත පරපුරේ ප්‍රයෝජනය සඳහා දේශයේ සියලු ම දැනුම අඩංගු මාධ්‍ය අත්පත් කර ගැනීම සහ සංරක්ෂණය කිරීමයි.**

රටක ප්‍රකාශයට පත්වන දැනුම අඩංගු මාධ්‍යයන්හි ග්‍රන්ථ විඥාපන පාලනය පිළිබඳ කේන්ද්‍රස්ථානය වන්නේ ජාතික පුස්තකාලයයි. ජාතික පුස්තකාල ස්ථාපිත වී ඇති සෑම රටකම ස්වකීය ප්‍රධාන වගකීමක් වන්නේ මෙලෙස ප්‍රකාශයට පත්වන දැනුම අඩංගු මාධ්‍යයන්හි ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු අළලා ජාතික ග්‍රන්ථ නාමාවලිය, සාධිකාරී ලේඛනයක් (Authority Document) ලෙස සම්පාදනය කිරීමයි.

## 02. එකතු සංවර්ධන ප්‍රතිපත්තිය හැඳින්වීම

ජාතික පුස්තකාලයක එකතු සංවර්ධන ප්‍රතිපත්තිය නිසැක වශයෙන් ම අවශේෂ පුස්තකාලයන්හි එකතු සංවර්ධන ප්‍රතිපත්තිවලට වඩා වෙනස්, විශේෂිත ලේඛනයක් වශයෙන් හඳුන්වා දිය හැකිය. ශ්‍රී ලංකාව තුළ උත්පාදනය වන සමස්ත ඥාන සම්භාරය ඒකරාශී කිරීම හා සංවිධානය කිරීම තුළින් දේශීය මෙන් ම විදේශීය තොරතුරු අවශ්‍යතා සපුරාලන, දැනුම පිළිබඳ කෝෂ්ඨාගාරයක් ලෙස ජාතික පුස්තකාලය හැඳින්විය හැක. එමෙන් ම ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා දීමෙන් ජාතික එකතුවේ උපයෝගීතාව උපරිම අන්දමින් වර්ධනය කිරීමට පියවර ගනු ලැබේ.

එකතු සංවර්ධන ප්‍රතිපත්තියක් යනු පුස්තකාලයක උපයෝජකයන්ට මෙන් ම කාර්යමණ්ඩලයට ප්‍රයෝජනවත් වන නිර්ණායක සමූහයකින් සැදුම් ලත් කරුණු ඇතුළත් ප්‍රතිපත්තිමය සැලැස්මකි. පුස්තකාල ද්‍රව්‍ය ප්‍රතිග්‍රහණ ක්‍රියාවලියට අමතරව ඉදිරි කටයුතු රාශියක් සඳහා මග පෙන්වනු ලබන මාර්ගෝපදේශයකි. එමෙන් ම ජාතික පුස්තකාලයේ ඉලක්ක හා අරමුණුවලට අදාළව පුස්තකාල සම්පත් එකතුව වර්ධනය හා සවිමත් කිරීම, දැනුම සංවිධානය හා කළමනාකරණය පිළිබඳව මග පෙන්වන ලේඛනයකි.

* ජනරජ ව්‍යවස්ථාව (1972) සම්මත වීමෙන් පසු එතෙක් ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය යනුවෙන් හැඳින් වූ මෙම මණ්ඩලය පසුව ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය යනුවෙන් හැඳින්විණ.

## 03. එකතු සංවර්ධන ප්‍රතිපත්තියේ මූලික අරමුණු

- ජාතික පුස්තකාලයේ එකතු සංවර්ධනයට හා ඇගයීමට එහි කාර්ය මණ්ඩලයට අවකාශයක් ලබා දෙන ප්‍රතිපත්තිමය ලේඛනයක් වීම.
- උපයෝජකයන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීමට මෙන් ම, එකතුව සංවර්ධනය කළ යුතු ආකාරය පිළිබඳ සැලසුම්කරණයට පාදක කර ගත හැකි ලේඛනයක් වීම
- ජාතික පුස්තකාලයේ එකතු සංවර්ධනය සඳහා වරණීය ප්‍රමුඛතා හඳුනාගෙන දේශීය හා විදේශීය සාමූහික ප්‍රයත්න මත එකතුවෙහි කාලීන වර්ධනයන් සිදු කිරීම.
- ජාතික එකතුවෙහි සමන්විත වන දැනුම අඩංගු මාධ්‍ය වර්තමාන මෙන් ම අනාගත පරපුර වෙත තොරතුරු ලබා දීමේ අභිලාෂයෙන් සංරක්ෂණ ක්‍රියාවලියට යොමු කරවීම.
- මුද්‍රිත,ශ්‍රව්‍ය දෘශ්‍ය, විද්‍යුත් සහ අප්‍රකාශිත දැනුම අඩංගු මාධ්‍ය තුළින් උපයෝජකයන්ට උපරිම සේවාවක් ලබා දීම.
- පුස්තකාල සම්පත් ප්‍රතිග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය මනා මූල්‍ය කළමනාකරණයකින් යුතුව ඉටු කිරීමට කාර්යමණ්ඩලයට හැකියාවක් ලැබීම.
- ජාතික එකතුවට ප්‍රවේශවන සියලු ම දැනුම අඩංගු මාධ්‍ය විමර්ශන සහ ශාස්ත්‍රීය කටයුතුවලට උපයෝගී කරගත හැකි වීම.
- පිළිගත් හා විධිමත් නිර්ණායක පදනම් කරගෙන ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තිය අනුව අපහරණ ක්‍රියාවලිය සිදු කිරීමට හැකියාවක් ලැබීම.

## 04. එකතු සංවර්ධන ප්‍රතිපත්තියක වැදගත්කම

### 4.1 සැලසුම්කරණය

ප්‍රතිපත්ති ලේඛනයක් මඟින් එකතුව ඇගයීමට ලක් කර අනාගත සැලසුම්කරණය සඳහා ප්‍රතිපත්ති තීරකයන්ට සහ වෘත්තීයමය කාර්යමණ්ඩලයට නිවැරදි තීරණ ලබා ගැනීමට තර්කානුකූල පදනමක් ලබා දේ. විශේෂයෙන් ම මූල්‍ය සම්පත් සීමිත අවස්ථාවල දී ප්‍රමුඛතා තීරණය කිරීමට එය සහාය වේ. පුස්තකාල සම්පත් ප්‍රතිග්‍රහණය කිරීම සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන සාධාරණ පදනමක් සහ නිර්ණායක මත අවස්ථානුකූලව මනා මූල්‍ය කළමනාකරණයකින් යුතුව ඉටු කර ගැනීමට ඉඩ සැලසේ.

### 4.2 පුස්තකාල සම්පත් තේරීම

පුස්තකාල සම්පත් තේරීම පිළිබඳ මඟ පෙන්වීමක් කාර්යමණ්ඩලයට ලබා දෙන්නේ මෙවැනි ප්‍රතිපත්තියක් මඟිනි. නීතිමය තැන්පතු හා **ISBN** තැන්පතුවට අමතරව පුස්තකාල සම්පත් තෝරා ගැනීමේ ක්‍රමවේදය යටතේ පහත දක්වා ඇති මූලාශ්‍ර ආශ්‍රයෙන් සුදුසු පුස්තකාල සම්පත් තෝරා ගැනීම සිදු කළ යුතුය.

- දේශීය හා විදේශීය ග්‍රන්ථ නාමාවලි සහ වෙළෙඳ ග්‍රන්ථ නාමාවලි
- පොත් අලෙවිහල්වලට යාම
- පොත් පිළිබඳ විචාර ලිපි (පුවත්පත් සහ සඟරාවල පළවන)
- දේශීය හා විදේශීය පොත් නාමාවලි
- පාඨක යෝජනා
- වෙබ් අඩවිවල දැක්වෙන පොත් අලෙවිහල්හි ඇති ග්‍රන්ථ පිළිබඳ විස්තර
- පොත් ප්‍රදර්ශනවලට යාම

### 4.3 පුස්තකාල සහයෝගීතාව

පුස්තකාල සහයෝගීතාව ඇතිකර ගැනීම සඳහා ද එකතු සංවර්ධන ප්‍රතිපත්තිය සහාය කර ගත හැකිය. ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ හා එකතු සංවර්ධන කටයුතු පිළිබඳව මේ මඟින් අනෙකුත්

පුස්තකාල දැනුවත් කළ හැකි අතර එමගින් සාමුහික ප්‍රතිග්‍රහණ කටයුතු, සම්පත් බෙදාගැනීම, අන්තර් පුස්තකාල පිරුළු සේවා හා ජාතික හා ජාත්‍යන්තර සහයෝගීතා වැඩසටහන් ඇතිකර ගැනීමට සහායක් ලබා ගත හැකිය. එමෙන් ම ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ කටයුතු පිළිබඳ අනෙකුත් දේශීය හා විදේශීය පුස්තකාල අතර දැනුවත්භාවය වර්ධනය කිරීම තුළින් සහයෝගීතාව වර්ධනය කර ගැනීමට හැකියාව ලැබේ.

**4.4 අදාළ පාර්ශව සහ උපයෝජක සබඳතා**

ජාතික පුස්තකාල එකතුව පරිහරණය කරන විද්වතුන්, පර්යේෂකයන් ඇතුළු සියලු ම උපයෝජකයන් සහ වෙනත් අදාළ පාර්ශව මෙම ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් වීම තුළින් ජාතික එකතුව සංවර්ධනය කර ගැනීම සඳහා ප්‍රතිග්‍රහණය කළ යුතු ග්‍රන්ථ පිළිබඳ ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබා ගත හැකි වේ. ඒ මගින් පාඨක අවශ්‍යතාවලට ගැලපෙන එකතුවක් ගොඩනගා ගැනීමට හැකි වේ. එමෙන් ම මෙම පාර්ශව හා උපයෝජකයින් සමඟ සබඳතා වර්ධනය කර ගැනීමට ද මෙම ප්‍රතිපත්තිය ආධාර කරගත හැකිය.

## 05. පුස්තකාල සම්පත් තෝරා ගැනීමේ ක්‍රමවේදය

ජාතික පුස්තකාලය සඳහා පුස්තකාල සම්පත් අයත් කර ගැනීමේ මාර්ග කිහිපයකි. කවර මාර්ගයකින් ලැබුණ ද මෙම සම්පත් පිළිබඳ තෝරා ගැනීමක් සිදු කෙරේ.

- තැන්පතු පිටපත් (ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව යටතේ ලැබෙන)
- මිල දී ගැනීම්
- පරිත්‍යාග (නියමිත මාර්ගෝපදේශ - උපලේඛන - අ)
- හුවමාරු සේවා (දේශීය හා විදේශීය)

## 06. එකතු සංවර්ධන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියා පිළිවෙළ

- ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ලැබෙන නීතිමය තැන්පතු පිටපත කාලීනව පුස්තකාල එකතුවට අත්පත් කරගත යුතුය.
- ජාතික එකතුව වර්ධනය කළ යුතු ආකාරය පිළිබඳ පාඨක සමීක්ෂණ පැවැත්වීම සහ එකතුව කාලීන වශයෙන් ඇගයීම කළ යුතුය.
- ජාතික එකතුව පරිහරණය කරනු ලබන උපයෝජකයන්ගේ ස්වභාවය සහ පරිහරණය කරන ලද සම්පත් පිළිබඳ දෛනික සංඛ්‍යා ලේඛන අඛණ්ඩව පවත්වාගෙන ගොස් විශ්ලේෂණය කළ යුතුය.
- ජාතික පුස්තකාලයේ එකතු සංවර්ධනය සම්බන්ධයෙන් වගකීම ප්‍රතිග්‍රහණ අංශයේ අංශ ප්‍රධාන ඇතුළු කාර්ය මණ්ඩලයේ මනා අධීක්ෂණය හා පාලනය යටතේ පවත්වා ගෙන යා යුතු අතර අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.
- අපහරණ ක්‍රියාවලියට අදාළ මූලික නිර්ණායක තීරණය කර ක්‍රියාත්මක කිරීමේ දී අදාළ විෂය ක්ෂේත්‍ර පිළිබඳ විශේෂඥ උපදෙස් මත අවස්ථානුකූලව සිදු කළ යුතුය. (උපලේඛන -ඇ)
- සමස්ත එකතුවේ භාවිතය පිළිබඳ ඇගයීමක් පාඨක සේවා අංශය වෙතින් කලින් කල ලබාගෙන ඒ අනුව එකතු සංවර්ධන ප්‍රතිපත්තිය වරින් වර සංශෝධනය කළ යුතු වේ.

## 07. පුස්තකාල සම්පත්

ජාතික එකතුව පහත සඳහන් පුස්තකාල සම්පත්වලින් සමන්විත වන අතර එය තවදුරටත් සංවර්ධනය කිරීම ජාතික පුස්තකාලයේ වගකීම වේ.

- නීත්‍යානුකූල තැන්පත් එකතුව - Legal Deposit Collection
- පුස්කොළ පොත් එකතුව - Palm Leaf Collection / Ola Leaf Collection

- අත් පිටපත් - Manuscripts
- අප්‍රකාශිත (ප්‍රකාශයට පත් නොවූ සුලභ නොවන ශාස්ත්‍රීය වටිනාකමින් යුතු ප්‍රකාශන) – Grey Literature
- දුර්ලභ ග්‍රන්ථ - Rare Books
- පොත් - Monographs
- වාර ප්‍රකාශන - Serials
- පුවත්පත් - Newspapers
- විමර්ශන මූලාශ්‍ර - Reference Sources (ශබ්දකෝෂ / විශ්වකෝෂ/ නාමාවලි)
- රජයේ ප්‍රකාශන - Government Publications
  - වාර්තා - Reports
  - ශක්‍යතා අධ්‍යයන - Feasibility Studies
  - ව්‍යාපෘති වාර්තා - Project Reports
  - පුස්තිකා - Pamphlets
  - චක්‍රලේඛ - Circulars
  - කොමිෂන් සභා වාර්තා - Commission Reports
  - සැසි වාර්තා - Sessional Papers
  - ගැසට් - Gazettes
  - පරිපාලන වාර්තා - Administration Reports
- ශ්‍රී ලංකා එකතුව - Sri Lanka Collection
- විදේශීය එකතුව- Foreign Collection
- පුස්තකාල හා විඥාපන විද්‍යා එකතුව - Library & Information Science Collection
- විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශක සංග්‍රහ - Syllabus & Teacher Guide Books
- පශ්චාද් උපාධි නිබන්ධන - Postgraduate Theses
- නාට්‍ය අත්පිටපත් - Drama Manuscripts
- පේටන්ට් - Patents
- පිරිවිතර - Specifications
- ප්‍රමිති - Standards
- ඡායාරූප - Photographs
- මුද්දර - Stamps
- සූක්ෂම සේයාපට/පත්‍ර - Microfilms/ Microfiches
- සංයුක්ත තැටි - CD/DVD
- ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය - Audio Visual Media
- විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා වන එකතු - Collections for Special Needs Persons
  - බ්‍රේල් ප්‍රකාශන - Brail Publications
  - කථන ග්‍රන්ථ එකතුව - Talking Books
- විද්‍යුත් ප්‍රකාශන - Electronic Resources
- පරිගණක දත්ත පදනම්- Computer Databases
- සමාලෝචන වාර්තා - Review Reports
- ඩිජිටල් සම්පත් - Digital Resources
- ජන සාහිත්‍ය එකතුව - Folk-lore Literature Collection
- සම්මන්ත්‍රණ පත්‍රිකා එකතුව - Conference Papers
- ප්‍රවෘත්ති පත්‍රිකා එකතුව - Newsletter Collection

- ළමා ග්‍රන්ථ එකතුව - Children's Book Collection
- මණ්ඩලයීය ප්‍රකාශන එකතුව - Board Publications Collection
- විද්වතුන්ගේ එකතුව - Collection of Scholars
    මාර්ටින් වික්‍රමසිංහ එකතුව- Martin Wickramasinghe Collection
- මැතිවරණ සාහිත්‍ය එකතුව - Election Literature Collection
- සිතියම් එකතුව- Map Collection
- අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ එකතුව - Intangible Cultural Heritage Collection

## 08. ජාතික පුස්තකාල එකතු සංවිධානයේ ප්‍රමුඛතා

ජාතික එකතුව සඳහා පිටපත් දෙකක් උපරිම වශයෙන් අත්පත් කර ගැනීම සිදු වේ. එහිදී පහත සඳහන් ප්‍රකාශන කෙරෙහි ප්‍රමුඛත්වය දක්වනු ලැබේ

- ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත්වන සියලු ම ප්‍රකාශන (සිංහල,දෙමළ,ඉංග්‍රීසි සහ වෙනත් භාෂා)
- ශ්‍රී ලංකාව පිළිබඳ විදේශීය රටවල පළවන ප්‍රකාශන
- ශ්‍රී ලාංකික කර්තෘන් විසින් විදේශ රටවල දී ලියා පළ කරන ප්‍රකාශන
- මූලික විමර්ශන ග්‍රන්ථ (ජාතික පුස්තකාලයේ පාඨක අවශ්‍යතා මත)
- ජාතික එකතුව සඳහා ගැලපෙන කාලීන විමර්ශන මූලාශ්‍ර - විමර්ශන මූලාශ්‍රවල නව සංස්කරණ අත්පත් කර ගැනීම
- පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට අයත් ප්‍රකාශන
- දකුණු ආසියානු කලාපයේ රටවල ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන (ශ්‍රී ලංකාව පිළිබඳව)
- බුද්ධාගම, ක්‍රිස්තියානි, හින්දු, ඉස්ලාම් යන ආගම්වලට අයත් ප්‍රධාන ග්‍රන්ථ
- විෂය සහ විශේෂ එකතුවලට අදාළ ප්‍රකාශන
- ශ්‍රී ලංකාව පිළිබඳව ආවරණය කරනු ලබන විෂය ක්ෂේත්‍ර (සියලු ම විෂය ක්ෂේත්‍ර)
- දේශීය දැනුමට අදාළ වාචික සම්ප්‍රදාය රැස්කිරීම (ලේඛනගත නොවී ජනවහරේ පවතින වාචික සම්ප්‍රදාය වාර්තාගත කොට රැස්කිරීම මින් අදහස් කෙරේ.)
- රජයේ ප්‍රකාශන (අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අධිකාරී ආයතනවල ප්‍රකාශයට පත් කරන ප්‍රකාශන)

## 09. පුස්තකාල සම්පත් අපහරණය

පුස්තකාල සම්පත් අපහරණය විධිමත් නිර්ණායක මත ඉටු කළ යුතුය (උපලේඛන -ඇ) අපහරණ කමිටුව විසින් එම නිර්ණායක සැලකිල්ලට ගත යුතුය

- ප්‍රතිසංස්කරණය කළ නොහැකි මට්ටමට හානියට පත් වූ ප්‍රකාශන
- එක් ග්‍රන්ථ නාමයකින් අවම වශයෙන් පිටපත් තුනකට වැඩි බහු පිටපත් සංඛ්‍යාවක් ඇති ප්‍රකාශන
- අස්ථානගත වූ පොත් අපහරණය කිරීමේ දී ඒ පිළිබඳ සාධාරණ හේතු සාධක ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය
- පාඨක සමීක්ෂණයකින් පසු වෙනත් විදේශ භාෂාවලින් රචිත භාවිත නොවන ප්‍රකාශන
- පැරණි සංස්කරණ අපහරණය (නව සංස්කරණ ඇති අවස්ථාවල දී සිදු කළ යුතුය)

## 10. එකතු සංවර්ධන ප්‍රතිපත්තිය සමාලෝචනය

සෑම වසර තුනකට වරක් ම (තාක්ෂණ ප්‍රගමනය, ආර්ථික, සමාජීය සහ ප්‍රතිපත්ති මත) එකතු සංවර්ධන ප්‍රතිපත්තිය කමිටුවක් මඟින් සමාලෝචනය කර, අවශ්‍ය සංශෝධන සිදු කර ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Guidelines For a Collection Development Policy Using the Conspectus Model (2001) International Federation of Library Associations and Institutions Section on Acquisition and Collection Development Retrieved from https://www.ifla.org/files/assets/acquisition-collection-development/publications/gcdp-en.pdf .(March 2020)

## උපලේඛනය - අ
## පරිත්‍යාග - පුද්ගල සහ ආයතන

ජාතික පුස්තකාලය සඳහා පරිත්‍යාග ලබා ගැනීමේ දී පහත සඳහන් නිර්ණායක උපයෝගී කර ගනී.

- ජාතික පුස්තකාල එකතුව සඳහා යෝග්‍ය ප්‍රකාශන පමණක් තෝරා ගැනීම සහ ආබද්ධ කිරීම.
- ජාතික පුස්තකාලය සඳහා පරිත්‍යාග ලබා ගැනීමේ දී අවශ්‍ය අවස්ථාවල දී කමිටුවක් මඟින් සිදු කරන අතර අවස්ථානුකූලව බාහිර විෂය ප්‍රවීණයන්ගේ සහාය ද ලබා ගැනේ.
- පරිත්‍යාග වශයෙන් ලබා ගන්නා ප්‍රකාශනවල භෞතික තත්ත්වය යහපත් තත්ත්වයක පැවතීම යෝග්‍යය.
- පැරණි, දුර්ලභ ප්‍රකාශන සංරක්ෂණය හා ප්‍රතිසංස්කරණය කළ හැකි අඩුපාඩුවලින් තොර ප්‍රකාශන විය යුතු ය.
- පරිත්‍යාග වශයෙන් ලබා ගන්නා ප්‍රකාශන පරිග්‍රහණ ලේඛනයට ඇතුළත් කිරීමේ දී එම ප්‍රකාශන පරිත්‍යාග වශයෙන් හඳුනා ගත හැකි ආකාරයට ඇතුළත් කළ යුතුය. (පරිග්‍රහණ ලේඛනයේ වෙනත් කරුණු යටතේ "පරිත්‍යාගයකි" යන්න සඳහන් කිරීම)
- පරිත්‍යාග වශයෙන් ලබා ගන්නා ප්‍රකාශන විස්තර, ඒවා ලබා දුන් පරිත්‍යාගශීලීන් පිළිබඳ තොරතුරු සහිතව වෙනම ලිපි ගොනුවක් පවත්වා ගෙන යා යුතුය.
- පරිත්‍යාග වශයෙන් ප්‍රකාශන ලබා දෙන පරිත්‍යාගශීලීන් හා ආයතන පිළිබඳව මණ්ඩලයීය ප්‍රවෘත්ති පත්‍රිකා හා වෙබ් අඩවිය මඟින් ප්‍රචාරයක් ලබා දිය යුතුය.

## උපලේඛනය - ආ
# විද්වත් එකතු ලබා ගැනීම

- විද්වතුන්ගේ එකතු ලබා ගැනීමේ දී එම විද්වතුන් විසින් කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළව සුවිශේෂ කැපී පෙනෙන සේවයක් කළ ශ්‍රී ලාංකික විද්වතෙක් විය යුතුය.
- ලබා ගන්නා විද්වතුන්ගේ සුවිශේෂ එකතු, පවතින ඉඩකඩ අනුව ජාතික පුස්තකාලයේ වෙනම විශේෂ එකතු ලෙස විද්වතුන් නමින් ප්‍රදර්ශනය කෙරේ.
- පැරණි හා දුර්ලභ පොත් තිබේ නම් ඒවා ප්‍රතිසංස්කරණය කළ හැකි මට්ටමේ ඒවා විය යුතුය.
- විද්වතුන්ගේ එකතු තෝරා ගැනීම ජාතික පුස්තකාලය සඳහා පත් කළ පුස්තකාල සම්පත් තෝරා ගැනීමේ කමිටුව මඟින් සිදු කළ යුතුය.
- ජාතික පුස්තකාලය සඳහා පොත් ලබා ගැනීමේ දී එක් පොතකින් පිටපත් තුනක් ලබා ගැනීම සාමාන්‍ය ප්‍රතිපත්තිය වුව ද විද්වතුන්ගේ එකතු ලබා ගැනීමේදී එම සීමාව නොසලකා කටයුතු කළ හැකිය.
- විද්වතුන්ගේ එකතු ලබා ගැනීමේ දී අදාළ විද්වතා ජීවත්ව නො සිටී නම් පවුලේ ඥාතියෙකුගෙන් හෝ දැනට ජීවත්ව සිටින ළඟම ඥාතියෙකුගෙන් පූර්ණ එකඟතාව ලබා ගත යුතුය. නැතිනම් පිළිගත හැකි පාර්ශවයක එකඟතාව ලබා ගත යුතුය.
- විද්වතුන්ගේ එකතු ජාතික පුස්තකාලයට භාර ගැනීමේ දී ලිඛිතව භාර දිය යුතු අතර භාර දීමෙන් පසු එය ජාතික පුස්තකාලයට අයත් දේපළක් ලෙස සැලකේ.
- විද්වතුන්ගේ එකතු ලබා ගැනීමෙන් පසු එම එකතුවලට අදාළව සිදු කරන ප්‍රතිග්‍රහණ කටයුතු, සංවිධානාත්මක කටයුතු, සංරක්ෂණ කටයුතු, ග්‍රන්ථ විඥාපන හා ප්‍රලේඛන කටයුතු ජාතික පුස්තකාලයේ පිළිගත් ක්‍රමවේද අනුව සිදු විය යුතුය.
- ජාතික පුස්තකාල එකතුවට සුදුසු එකතු, ගවේෂණය කර සුදුසු ඒවා අයත් කර ගැනීමට ජාතික පුස්තකාලයේ ප්‍රතිග්‍රහණ අංශය විසින් කමිටු අනුමැතිය අනුව සිදු කළ යුතුය.
- විද්වත් එකතු හඳුනා ගැනීම ද්විපාර්ශවීය ගිවිසුමක් මත සිදුවන අතර එම ගිවිසුම ප්‍රකාරව ජාතික එකතුවට ආබද්ධ කළ යුතුය.
- ජාතික පුස්තකාලයට ලබා ගන්නා විද්වතුන්ගේ එකතු නිත්‍ය විමර්ශන එකතු ලෙස සැලකිය යුතුය.

## උපලේඛනය - ඇ
## අපහරණ නිර්ණායක

- වාර්ෂික ප්‍රකාශනවල නව සංස්කරණ ලැබීමෙන් පසු පැරණි සංස්කරණ අපහරණය කිරීම.
- පාඨකයින් විසින් දීර්ඝ කාලයක් භාවිත නොකරන ලද ප්‍රකාශන අපහරණය කිරීම.
- එකම ග්‍රන්ථයෙන් පිටපත් තුනකට වඩා ඇති බහු පිටපත්වලින් සමන්විත ප්‍රකාශන අපහරණය කිරීම.
- කාලීන තොරතුරු ඇතුළත් නොවන ශ්‍රී ලංකාව පිළිබඳව වැදගත්කමක් නොමැති කරුණු අන්තර්ගත ප්‍රකාශන අපහරණය කිරීම.
- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලට අමතරව පාඨකයින් විසින් භාවිත නොකරන වෙනත් භාෂාවලට අයත් ප්‍රකාශන අපහරණය කිරීම.
- දශක තුනකට පෙර සංඛ්‍යා දත්ත ඇතුළත් ප්‍රකාශන, තොරතුරු ඇගයීමක් කර අපහරණය කිරීම.
- තවදුරටත් සංරක්ෂණය කිරීමෙන් ඵලදායී වෙතැයි සිතිය නොහැකි ප්‍රකාශන, පැරණි තොරතුරු ඇතුළත් පුස්තිකා අපහරණය කිරීම.
- පාඨකයින් විසින් භාවිත කර නොමැති විවිධ ආයතනවල වසර තිහකට වැඩි වාර්ෂික වාර්තා සහ ගිණුම් වාර්තා ඇතුළත් ප්‍රකාශන අපහරණය කිරීම.
- පාඨක යෝජනා සහ විෂය ප්‍රවීණයන් විසින් අපහරණය කළ යුතු බවට කෙරෙන යෝජනා මත අපහරණය කිරීම.

## සංක්ෂිප්ත පද මාලාව

IFLA – International Federation of Library Associations and Institutions
ISBN – International Standard Book Number
UNESCO - United Nations Educational, Scientific and Cultural Organization